පොදු චක්‍රලේඛ අංක : 01-04/2022

මාගේ අංකය:06/G/ADT&STV/App.(2021)
385,සුවසිරිපාය,
පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

2022.01. 25

සියළුම ආයතන ප්‍රධානීන් වෙත,

**සෞඛ්‍ය අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශයට අභ්‍යන්තර විගණන නිලධාරීන්/ ගබඩා සමීක්ෂණ අංශයට ගබඩා සමීක්ෂණ නිලධාරීන් තෝරා පත්කර ගැනීම.**

රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවයේ නිලධාරීන්ගෙන් පහත සඳහන් සුදුසුකම් මත අභ්‍යන්තර විගණන/ගබඩා සමීක්ෂණ නිලධාරීන් වශයෙන් පත්කර ගැනීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. සෞඛ්‍ය අමාත්‍යාංශයේ විභාග ශාඛාව මගින් පහත අංක 04 ඡේදයෙහි සඳහන් විෂයන්ට අදාළව ලිඛිත තරඟ විභාගයක් පවත්වා සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයකින් පසු පුරප්පාඩු සඳහා බඳවා ගැනීම් සිදු කරනු ලැබේ. සෞඛ්‍ය අමාත්‍යාංශය, සෞඛ්‍ය අමාත්‍යාංශය අනුබද්ධිත රාජ්‍ය අමාත්‍යාංශ හෝ එම අමාත්‍යාංශවලට අයත් රෝහල්/ආයතන අනුයුක්තව සේවය කරනු ලබන රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවයේ නිලධාරීන් පමණක් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

**02.** අවශ්‍ය සුදුසුකම් :-

අයදුම්කරුවන් පහත සඳහන් සුදුසුකම් සපුරාළිය යුතුය.

I. 2021.07.01 දිනට වයස අවුරුදු 50 ට නොවැඩි විය යුතුය.
II. එදිනට සතුටුදායක සේවා කාලය අවුරුදු 05 ක් සම්පූර්ණ කර ඇති දැනට සෞඛ්‍ය අමාත්‍යාංශය, සෞඛ්‍ය අමාත්‍යාංශය අනුබද්ධිත රාජ්‍ය අමාත්‍යාංශ හෝ එම අමාත්‍යාංශවලට අයත් රෝහල්/ආයතන අනුයුක්තව සේවය කරනු ලබන රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවයේ නිලධාරීන් විය යුතුය. (කාර්යක්ෂමතා කඩඉම් සම්පූර්ණ කිරීමට නොහැකි වූයේ නිලධරයාගේ පාලනයෙන් බැහැර කරුණක් හේතුවෙන් නම් මෙය අදාල නොවනු ඇත.)
III. පරිගණක භාවිතය පිළිබඳ මනා පළපුරුද්දක් තිබිය යුතුය.
IV. පසුගිය අවුරුදු 05 ඇතුලත තමා භාරයේ තිබූ රජයේ බඩුභාහිරාදිය නැතිවීම හෝ වෙනත් අක්‍රමිකතා සම්බන්ධයෙන් දඬුවම් ලැබූ හෝ අධිභාරයන්ට යටත් නොවූ අයෙකු විය යුතුය.
V. 2021.07.01 දිනට පූර්වාසන්න වසර 05 ක කාලය තුල කිසිම විනය දඬුවමකට භාජනය නොවූ හා විනයානුකූල කටයුතු ආරම්භ වී නොමැති නිලධාරියෙකු /නිලධාරිණියක විය යුතුය.
VI. සාමාන්‍ය රාජකාරී වේලාවෙන් පරිබාහිරව සේවය කල හැකි අයෙකු හා දිවයිනේ ඕනෑම ස්ථානයක රාජකාරී කල හැකි අයෙකු විය යුතුය.
VII. ආදර්ශමත් චරිතයකින් යුතු කාර්යශීලී, උපායශීලී අයෙකු විය යුතු අතර, මනා සෞඛ්‍ය තත්වයකින් පසුවන අයෙකු ද විය යුතුය.

**03.** අයදුම්කරන ක්‍රමය :-

මෙම නිවේදනයේ යා කර ඇති ඇමුණුම 01 ආකෘතියට අනුව පිළියෙල කරගත් අයදුම්පත් **2022.02.25** දිනට ප්‍රථම අයදුම්කරු විසින් තමාගේ ආයතන ප්‍රධානියා වෙත බාර දිය යුතු අතර ආයතන ප්‍රධානීන් තමා වෙත ලැබෙන අයදුම්පත් නිර්දේශ සහිතව උපලේඛණ ගත කොට **2022.03.06** දිනට පෙර **නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන)** I, **385, සුවසිරිපාය, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10** ලිපිනය වෙත එවීමට වග බලා ගත යුතුය. ප්‍රමාදයක් ඇතිවීම වැළැක්වීම සඳහා අයදුම්කරුවන් විසින් තම අයදුම්පත් නියමිත දිනට හෝ ඊට පෙර තම ආයතන ප්‍රධානියාට ලැබෙන සේ ඉදිරිපත් කළ යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් සම්බන්ධයෙන් සළකා බලනු නොලැබේ. චක්‍රලේඛයේ සඳහන් කොන්දේසි සපුරන ලද අයදුම්පත් පමණක් නිර්දේශ සහිතව එවිය යුතුය.

**04. විෂය නිර්දේශය**

සෞඛ්‍ය අමාත්‍යාංශයේ විභාග ශාඛාව මඟින් පහත සඳහන් විෂයන්ට අදාළව ලිඛිත තරඟ විභාගය පවත්වනු ලැබේ.

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත්වීමට ලබාගතයුතු අවම ලකුණු |
|---|---|---|---|
| (1) ආයතන සංග්‍රහය | පැය 01 | 100 | 40 |
| (2) මුදල් රෙගුලාසි | පැය 01 | 100 | 40 |
| (3) රෝහල් පරිපාලනය | පැය 01 | 100 | 40 |

**05. බඳවාගැනීමේ ක්‍රමය :-**

මෙම චක්‍රලේඛයේ 02 ඡේදයේ සඳහන් සුදුසුකම් සෑම ආකාරයකින්ම සපුරා ඇති අයදුම්කරුවන් සඳහා පවත්වනු ලබන ලිඛිත තරඟ විභාගයේ මුළු ලකුණු ගණනින් (විෂයන් සියල්ල සමත් වී තිබිය යුතුය) කුසලතා අනුපිළිවෙල හා පවත්නා පුරප්පාඩු ප්‍රමාණය අනුව සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයකින් පසු පුරප්පාඩු සඳහා බඳවා ගන්නා නිලධාරීන් හට සති 02ක විෂයානුබද්ධ පුහුණුවක් ලබා දීමෙන් අනතුරුව ඉහත තනතුරු සඳහා අනුයුක්ත කරනු ලැබේ.

එහිදී ඉහළම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව අභ්‍යන්තර විගණන නිලධාරි තනතුරටත්, එම පුරප්පාඩු සම්පූර්ණ වීමෙන් පසු ඊළඟට ලකුණු ලබාගත් අයදුම්කරුවන් ගබඩා සමීක්ෂණ නිලධාරී තනතුරටත් තෝරාගනු ලැබේ. මෙහිදී ඉහළම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් සඳහා තමන්ගේ කැමැත්ත පරිදි ගබඩා සමීක්ෂණ නිලධාරී තනතුරට වුවද ඉල්ලුම් කරනු ලැබීමට අවස්ථාව ලබාදිය හැක.

මෙම විභාගය හා සම්මුඛ පරීක්ෂණය කොළඹ දී පැවැත්වෙන අතර මේ සම්බන්ධයෙන් ගමන් වියදම් හෝ වෙනත් කිසිම වියදමක් අයදුම්කරුවන්ට ගෙවනු නොලැබේ. එසේ වුවද රාජකාරි නිවාඩු සඳහා හිමිකම ඇත.

**06. තනතුරෙහි සේවා කාලය**

තනතුරෙහි සේවා කාලය වසර 05 ක් වේ. අභ්‍යන්තර විගණන නිලධාරි හා ගබඩා සමීක්ෂණ නිලධාරි තනතුරුවල මේ වන විට වසර 05කට වඩා සේවයේ නියුතු නිලධාරීන්ටද ඉහත සුදුසුකම් සපුරාලීම මත නැවත එම තනතුරට ඉල්ලුම් කර හැක.

ඩී. එල්. යූ. පීරිස්
අතිරේක ලේකම්
සෞඛ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
කොළඹ 10.

ඩී.එල්.යූ. පීරිස්
අතිරේක ලේකම් (පාලන) I
සෞඛ්‍ය අමාත්‍යාංශය

අත්.කළේ/ වෛද්‍ය එස්.එච්. මුණසිංහ
ලේකම්.

ඇමුණුම 01

**සෞඛ්‍ය අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශයට / ගබඩා සමීක්ෂණ අංශයට නිලධාරීන් තෝරා ගැනීම සඳහා ආදර්ශ අයදුම්පත්‍රය.**

01. අයදුම්කරුගේ නම :- (සම්පූර්ණයෙන්) ...............................................................................................................
...............................................................................................................

02. (අ) තනතුර :-...............................................................................................................

(ආ) පන්තිය/ශ්‍රේණිය :-...............................................................................................................

03. උපන්දිනය :- ...............................................................................................................

2021.07.01 දිනට වයස :- අවුරුදු ................. මාස ............... දින.........................................

04. දැනට සේවය කරන ආයතනය/සේවා ස්ථානය :- ...............................................................................................................

05. (අ) පළමු පත්වීම් දිනය හා තනතුර :- ...............................................................................................................

(ආ) වර්තමාන තනතුර හා එම තනතුරට පත්වූ දිනය :- ...............................................................................................................

(ඇ) වර්තමාන පන්තියට/ශ්‍රේණියට අදාල කාර්යක්ෂමතා කඩඉම් විභාගය සම්පූර්ණ කළ දිනය :-...............................................................................................................

06. (අ) මුල් පත්වීම් ලද දින සිට සේවය කල ස්ථානය හා දරන ලද තනතුර:-

| ස්ථානය | කාල සීමාව | | තනතුර |
|---|---|---|---|
| | සිට | දක්වා | |
| 1 | | | |
| 2 | | | |
| 3 | | | |
| 4 | | | |
| 5 | | | |
| 6 | | | |
| | | | |

(ආ) අභ්‍යන්තර විගණන අංශයේ /ගබඩා සමීක්ෂණ අංශයේ ක්ෂේත්‍ර සේවය පිළිබඳ පලපුරුද්ද

| අංශය | කාල සීමාව | | ක්ෂේත්‍ර සේවයෙන් ඉවත් වීමට හේතු |
|---|---|---|---|
| | සිට | දක්වා | |
| | | | |

07. (අ) සිංහල/දෙමළ ප්‍රවීණතාව :- ...............................................................................................................

(ආ) ඉංග්‍රීසි ප්‍රවීණතාව :- ...............................................................................................................

(සමත් වී ඇති විභාගය, වර්ෂය හා ලබා ඇති ශ්‍රේණීන් සඳහන් කරන්න)

08. පසුගිය අවුරුදු පහ (05) ඇතුළත නිලධාරියා භාරයේ තිබූ රජයේ බඩු බාහිරාදිය නැතිවීම සම්බන්ධයෙන් අධිභාරයට භාජනය වී ඇත්ද? යන වග හා එවැනි සිදුවීමක් ඇත්නම් ඒ පිළිබඳ විස්තර :- ..............................................................................................................................................
..............................................................................................................................................
..............................................................................................................................................
..............................................................................................................................................

09. නිලධාරියා 2021.07.01 දිනට පූර්වාසනන වසර පහක ( 05) කාලය තුළ විනයානුකූල දඬුවමකට භාජනය වී ඇතිද යනවග. (එසේ දඬුවම් ලබා තිබේ නම් විනය නියෝගයෙහි පිටපතක් ඇමිණිය යුතුය) :- ..............................................................................................................................................
..............................................................................................................................................

10. පසුගිය නිවාඩු පිළිබඳ විස්තර

| වර්ෂය | අනියම් | විවේක | අඩවැටුප් | වැටුප් රහිත |
|---|---|---|---|---|
| 2016 | ........... | ........... | ............... | ................. |
| 2017 | ........... | ........... | ............... | ................. |
| 2018 | ........... | ........... | ............... | ................. |
| 2019 | ........... | ........... | ............... | ................. |
| 2020 | ........... | ........... | ............... | ................. |
| 2021 | ........... | ........... | ............... | ................. |

මා විසින් ඉහත දක්වා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි.

දිනය :- ..........................................

.......................................................
අයදුම්කරුගේ අත්සන

11. ආසන්නතම අධීක්ෂණ නිලධරයාගේ සහතිකය:-

(අ) පැමිණීම :- ..............................................................................................................

(ආ) වැඩ :- ..............................................................................................................

(ඇ) හැසිරීම :- ..............................................................................................................

අයදුම්කරු විසින් ඉහත අංක 1 – 10 දක්වා ඡේදයන්හි සඳහන් කර ඇති තොරතුරු පෞද්ගලික ලිපිගොනුව අනුව නිවැරදි බව සහතික කරමි.

දිනය :- ..........................................

.......................................................
අත්සන හා නිලමුද්‍රාව

12. නිලධාරියා සම්බන්ධයෙන් ආයතන ප්‍රධානියාගේ නිර්දේශය:-

ඔහුගේ/ඇයගේ අයදුම්පතෙහි දැක්වෙන විස්තර මෙම දෙපාර්තමේන්තුවේ ඇති පෞද්ගලික ලිපි ගොනුව අනුව හරි වැරදි බලා ඇති බව ද සහ මෙම විභාගයට අදාළ විභාග නිවේදනයේ දැක්වෙන රෙගුලාසි අනුව මෙම විභාගයට පෙනී සිටීමට ඔහු/ඇය සුදුසු බව ද මම සහතික කරමි.

දිනය :- ..........................................

.......................................................
ආයතන ප්‍රධානියාගේ අත්සන නිලමුද්‍රාව

General Circular No.: 01-04/2022

My Number: 06/G/ADT&STV/App.(2021)
385, Suwasiripaya,
Rev.Baddegama Wimalawansa Thero
Mawatha,
Colombo 10
25/01/2022

All Heads of Institutions,

**Selection of Internal Audit Officers to the Internal Audit Branch / Stock Verification Officers to the Verification Branch of the Ministry of Health.**

Applications are invited from officers in the post of Public Health Management Assistant who have possessed following qualifications for appointing to the post of Internal Audit Officer / Stock Verification Officer. Recruitment to the vacant posts shall be made on the results of a written competitive examination which consists of the following subjects mentioned in the paragraph 04 of this circular, conducted by the Examination Branch of the Ministry of Health, and an interview for verification of qualifications. Only the officers who are serving attached to the Ministry of Health and state ministries affiliated to the Ministry of Health or hospitals / institutions belonging to the said ministries, shall submit their applications.

**02. Required Qualifications:**

Following qualifications shall be satisfied by candidates.

I. Shall be not more than 50 years of age as at the date of 01.07.2021.
II. Shall be the officers in the Service of Public Health Management Assistant who have completed a satisfactory service period of 05 years as at the said date and who are serving attached to the Ministry of Health and state ministries affiliated to the Ministry of Health or hospitals / institutions belonging to the said ministries.
III. Shall have good experience in computer usage.
IV. Shall be a person who has not been subject to punishment for loss of articles belonging to the government which are in his own custody, or other irregularities, or to surcharge within the last 05 years.
V. Shall be an officer who has not been subject to any disciplinary punishment and no disciplinary action has been initiated during the five years immediately proceeding as at 01.07.2021.
VI. Shall be a person who is able to perform duties outside normal duty hours and to serve in any place of the island.
VII. Shall be of excellent in character, active, tactful and in good health condition.

## 03. Method of Application:

Applications prepared in compliance with the form in the annexure – 01 appended to this notification shall be handed over to the respective Head of Institution by the candidate before **25.02.2022**. Application received by the Heads of Institution shall be scheduled with their recommendation and action shall be taken to send the application to reach **Deputy Director General (Admin) 01, 385, Rev.Baddegama Wimalawansa Thero Mawatha, Colombo 10** before **06.03.2022**. Candidates are requested to submit their applications to the respective Head of Institution on or before the due date to prevent delays. The applications received after the closing date of applications will not be considered. Only the applications which fulfil the conditions stipulated in the circular, shall be sent with recommendations of the respective Head of Institution.

## 04. Syllabus

The written examination consists of following subjects and will be held by the Examination Branch of the Ministry of Health.

| Question paper | Time | Total Marks | Minimum marks required to pass |
|---|---|---|---|
| (1) Establishments Code | 01 hour | 100 | 40 |
| (2) Financial regulations | 01 hour | 100 | 40 |
| (3) Hospital Administration | 01 hour | 100 | 40 |

## 05. Method of Recruitment

Candidates who have satisfied the qualifications stated in the paragraph 02 of this circular in all aspects, will be recruited to fill the vacancies on the order of the merit of the candidates as per the total marks (all subjects shall be passed) scored in the written examination and the interview for verification of qualifications. Officers recruited as so, will be attached to the aforesaid posts after a subject related training of two (02) weeks.

Candidates who have obtained highest marks, will be selected for the post of Internal Audit Officer as per the existing number of vacancies and after filling the said vacancies, candidates who have obtained next highest marks, will be selected for the post of Stock Verification Officer. Candidate who have obtained highest marks, could even apply for the post of Stock Verification Officer of their preference.

The said examination and the interview will be held in Colombo and the traveling expenses or any other expense will not be paid for the candidates. However, candidates are entitled to duty leaves.

## 06. Service period of the post

Service period of the post is five (05) years. Officers who are serving in the post of Internal Audit Officer and Stock Verification Officer more than five (05) years by now and upon satisfying the above qualifications, can re-apply.

D.L.U. Peiris
Additional Secretary (Admin) 01
Ministry of Health

**D. L. U. PEIRIS**
Additional Secretary
Ministry of Health
"Suwasiripaya"
Colombo 10.

Signed by/ Dr. S.H. Munasinghe
Secretary

Annexure – 01

## Specimen Application Form for Selection of Officers to the Internal Audit Branch /Stock Verification Branch of the Ministry of Health

01. Name of the Applicant (in full) ..............................................................................................

................................................................................................................................................

02. (a) Post:-...............................................................................................................................

(b) Class/Grade:-.......................................................................................................................

03. Date of Birth: - ......................................................................................................................

Age as at 01.07.2021: -

Years................. Months............. Days.......................................

04. Institution/Service Station presently serving: - ...........................................................

05. (a) First appointment date and post: - ..................................................................

(b) Present post ant date of appointment to the present post: -. ..................................................

(c) Date completed the efficiency bar examination relevant for the present Class / Grade: - .......................................................

06. (a) Places of work and posts held from the date of first appointment:-

| Place of work | Period | | Post |
|---|---|---|---|
| | From | To | |
| 1 | | | |
| 2 | | | |
| 3 | | | |
| 4 | | | |
| 5 | | | |
| 6 | | | |
| | | | |

(b) Experience of field service in the Internal Audit Branch / Stock Verification Branch

| Branch | Period | | Reason for leaving the Field Service |
|---|---|---|---|
| | From | To | |
| | | | |

07. (a) Proficiency in Sinhala / Tamil :- ..............................................................................

(b) Proficiency in English:- ..............................................................................................

(Mentioned the Examination passed, year and Grades obtained)

08. Mentioned whether the officer has been surcharged of any loss of Government articles which were in the custody of the officer during the preceding five (05) years Particulars if so :- ..........................................................................................................................
..........................................................................................................................
..........................................................................................................................
..........................................................................................................................

09. Mention whether the officer has been subjected to any disciplinary punishment during the five (05) years immediately prior to 01.07.2021. (If any disciplinary punishment has been imposed against the officer attach a copy of the disciplinary order) :- ..........................................
..........................................................................................................................
..........................................................................................................................

10. Past Leave Particulars

| Year | Casual | Vacation | Half-Pay | No-pay |
|---|---|---|---|---|
| 2016 | ........... | ........... | ............... | ................. |
| 2017 | ........... | ........... | ............... | ................. |
| 2018 | ........... | ........... | ............... | ................. |
| 2019 | ........... | ........... | ............... | ................. |
| 2020 | ........... | ........... | ............... | ................. |
| 2021 | ........... | ........... | ............... | ................. |

I do certify that above particulars furnished by me are true and correct.

Date: - ...........................................

.......................................................
Signature of the applicant

11. Certification of the immediate supervising officer: -

(a) Attendance :- ..........................................................................................................

(b) Work :- ..........................................................................................................

(c) Conduct :- ..........................................................................................................

I do certify that above particulars provided by the applicant from No.01 – 10 above are correct according to his / her personal file.

Date: - ...........................................

.......................................................
Signature and Official Stamp

12. Certification of the Heads of the Institution: -

I do certify that above particulars furnished in the application of the officer were checked with the personal file of the officer which is in this Department and that the applicant is eligible to appear for this examination according to the regulations set out in the notification relevant to this examination.

Date: - ...........................................

.......................................................
Signature and Official Stamp of the Head of the Institution